# ලක්ෂ 2 1/2 ක් කොටි වෙලා

# ආණ්ඩුව අප්සෙට්

**වන්නිය තුළට දැවැන්ත බර අවි ප්‍රහාරයන් ගුවනින්, මුහුදින් හා ගොඩ බිමින් එල්ල කරමින් විමුක්ති කොටි සංවිධානයේ නායකයන් ජීවග්‍රහයෙන් අල්ලා ගැනීම හෝ මරා දැමීම මගින් විමුක්ති කොටි සංවිධානය සමූලඝාතනයට ලක්කිරීම ඉලක්ක කරගත් මහා යුධ මෙහෙයුම් හමුවේ තමන්ගේ දේශපාලන තක්සේරුව පරිදි මන්නාරමේ, මුලතිව් හා කිලිනොච්චියේ දෙමළ වැසියන් වන්නියේ දකුණු කෙලවරේ පිහිටි වව්නියාව කරා සැඩ පහරක් සේ ගලා එනු ඇතැයි තක්සේරු කර සිටි ආණ්ඩුව එය කිසි ලෙසකින්වත් සිදු නොවනු දැක මහත් වික්ෂිප්ත භාවයට පත්ව සිටින බව එහි අභ්‍යන්තර ආරංචි මාර්ග සඳහන් කරයි.**

එසේ දෙමළ වැසියන් දරු පවුල් පිරිවරා වව්නියාවේ සාදා ඇතැයි තමන් ප්‍රචාරය කළ වසන්ත කඳවුරට නොපැමිණ ලක්ෂ ගණනින් මුලතිව් දිස්ත්‍රික්කයේ ඊසානදිග විවෘත බිමෙහි ආරක්ෂාව පතා යෑම සිදුවූයේ කෙසේද යන්න ආණ්ඩුවේ ප්‍රතිපත්ති තීරකයන් අතර බරපතල සාකච්ඡාවන්ට භාජනය වී ඇති බවද වාර්තාවේ. දෙමළ වැසියන් ගත් මේ පියවර නිසා විමුක්ති කොටි සංවිධානය දෙමළ ජනතාවටත් එපා වූ රුදුරු සංවිධානයක් ලෙසට ජාත්‍යන්තර වශයෙන් ගෙන ගිය ප්‍රචාරයන් බොරු බවට පත් වීම වලක්වා ගන්නේ කෙසේද යන්න ගැනත්, එමෙන්ම මෙම තත්ත්වය තුළ නැවත වතාවක් ජාත්‍යන්තර මානව හිමිකම් සංවිධානවලට හා සාම සාකච්ඡාකරුවන්ට ලංකාවේ තත්ත්වය ගැන සාකච්ඡාවට ඇතුල් වීමට අවස්ථාව පැදීම ගැනත්, විශේෂයෙන් මේ ජනතාවගෙන් කිසිම ප්‍රතිශතයක් වෙනත් අවස්ථාවලදී මෙන් තමිල්නාඩුවට ගලා යෑමට කටයුතු නොකිරීමත් එම සාකච්ඡාවල ප්‍රධාන තැන ගෙන ඇති බවද එම ආරංචි මාර්ග පවසයි.

මේ සම්බන්ධයෙන් හරය කළ විමසුමකට පිළිතුරු දෙමින් වාමාංශික පෙරමුණේ නායක ආචාර්ය වික්‍රමබාහු කරුණාරත්න ප්‍රකාශ කර සිටියේ තම සංවිධානය දිගින් දිගටම පෙන්වා දුන් පරිදි විමුක්ති කොටි සංවිධානය දෙමළ ජනතාවගේ කම්කටොළු තුළින් බිහිවූ විමුක්ති සංවිධානයක් බවත් ඒ නිසා කිසිදා එම සංවිධානය දෙමළ ජනතාවගෙන් වෙන්කර පහර දීමට ආණ්ඩුවට අවස්ථාවක් නොලැබෙන බවත් ය. මේ තත්ත්වය තේරුම් ගැනීමට නොහැකි රාජපක්ෂ පාලක කල්ලිය කාලතුවක්කු උණ්ඩවලට බයේ දෙමළා දරුපවුල් කරගසා ගෙන වව්නියාවට පැමිණෙතැයි කල්පනා කිරීම පෙන්වන්නේ මේ පාලක කල්ලියේ අමනකම බවද ඔහු පෙන්වා දුන්නේය. සිංහල පාලකයන්ගේ හා ප්‍රතිගාමී ඊනියා බුද්ධිමතුන්ගේත් පාගාදමනු ලැබීමත්, අවඥාවට භාජනය කරනු ලැබීමත් වෙනුවට හිස කෙලින් තබාගෙන ගර්වයෙන් යුතුව ජීවත් වීමට අවස්ථාව ලද්දේ විමුක්ති කොටි සංවිධානය විසින් අත්පත් කර ගනු ලැබූ ජයග්‍රහන නිසා යයි දෙමළ ජනයා තේරුම්ගෙන සිටින බවත්, වැඩිදුරටත් පෙන්වා දෙන හෙතෙමේ යම් යම් හේතු මත විමුක්ති කොටි සංවිධානයට සතුරු ආකල්පයන් දක්වූ බොහෝ දෙමළ ජාතිකයන් පවා විමුක්ති කොටි සංවිධානයේ ආරක්ෂාව වෙනුවෙන් අද පෙනී සිටින බවද අවධාරණය කළේය.

නිළ වාර්තා දක්වන පරිදි මේ වන විට ලක්ෂ දෙකක් (200,000) ක් දෙමළ වැසියන් නගර වලින් හා ගම් වලින් කිලිනොච්චියටත් A9 මාර්ගයේ නැගෙනහිර ප්‍රදේශ වලටත් ගලාවිත් සිටී. කිලිනොච්චිය හමුදා ප්‍රහාරයන්ගේ මීළඟ ඉලක්කය වීමත් සමඟ විමුක්ති කොටි සංවිධානය මේ දෙමළ වැසියන්ට ඊසාන දිග මුලතිව්හි ආරක්ෂිත ප්‍රදේශයක් වෙත යවා තිබේ.

මේ තත්ත්වය පිළිබඳව පසුගියදා මන්නාරමේ සංචාරයක් සඳහා ගිය එක්සත් කම්කරු සම්මේලනයේ ප්‍රධාන ලේකම් සරණපාල සිල්වා ප්‍රකාශ කර සිටියේ එහි වැසියන් කිසිසේත්ම වව්නියාව ආරක්ෂිත ප්‍රදේශයක් ලෙස නොසලකන බවයි. ආණ්ඩුවේ බලාපොරොත්තුව වූයේ දහස් ගණනින් ජනයා තම පාලන ප්‍රදේශ වලට ගලා ඒම බවත්, එසේම එය පෙන්වා තමන්ගේ යුධවාදය සාධාරණය කරගැනීම බවත්, නමුත් එය කිසිසේත්ම ඵලදායී නොවූ බවත් සරණපාල සිල්වා පෙන්වා දුන්නේය. ".....වව්නියාව ආරක්ෂා සහිතයි කියල කොහොමද දෙමළ ජනතාව කල්පනා කරන්නේ..... නිල නොවන හමුදා කල්ලි නිතිපතාම වාගේ ගරිල්ලා කේඩර් වරු කියල සැක කරන තරුණයන්ව වව්නියාවේ තැන් තැන් වල මරල දාන බව ඔවුන් හොඳටම දන්නවා. මේ බොහොමයක් පවුල් වල අඩුතරමේ එක්කෙනෙක්වත් විමුක්ති කොටි සංවිධානයේ සාමාජිකයෙක්. ඉතිං ඔවුන් බයයි මේ ගැන දැනගත් ඕනෑම වෙලාවක පිස්තෝල කල්ලිවලට ගොදුරුවෙයි කියල. ඒ වගේම ඒ අය තමන්ගේ ගැටවර වයසේ දරුවන්ට මේ ආණ්ඩුවේ කඳවුරු වල ආරක්ෂාව තියේවි කියල කොහොමටවත් විශ්වාස කරන්නේ නැහැ. ඔවුන්ව ලිංගික හිරිහැරවලට ලක් වීමට ඇති ඉඩ ගැනත් බයයි. පරණ අත්දැකීම් ඒ අයගේ හිතේ තියෙනවා......". ඒ, පවතින තත්ත්වය ගැන මන්නාරමේ දෙමළ ජාතික ග්‍රාම නිලධාරියෙකු තමන් ව හෙළිදරව් නොකරන මෙන් ඉල්ලා සිටිමින් එ.ක.ස. ලේකම් සරණපාල සිල්වා ට පවසා ඇති තත්ත්වයයි.

මේ අතර උතුරු නැගෙනහිරින් බස්නාහිර පළාතට සංක්‍රමණය වූ වැසියන් පොලිසියේ ලියාපදිංචි කිරීම පසුගිය දා සිදුවිය. මේ සම්බන්ධයෙන් කලක් තිස්සේ කොළඹ පදිංචිව සිටින සමධර්මම් කර්තෘ මණ්ඩලයේ වල්ලිපුරම් තිරුනාවුකරසු ගෙන් "හරය" කළ විමසුමකට පිළිතුරු දුන් හෙතෙමේ කියා සිටියේ එම ලියාපදිංචිය තමාට අදාල නොවන බවත්, තමන් වසර දහයකටත් වැඩි කාලයක් කොළඹ පදිංචිව සිටින බවත්ය. වැඩිදුරටත් විමසුමට පිළිතුරු දුන් ඔහු කීවේ ලියාපදිංචිය අදාල අවුරුදු 05 කට වඩා අඩුකාලයක් කොළඹ දිස්ත්‍රික්කයේ පදිංචිය සිටින අයට පමණක් බවය. එවිට "හරය" විමසා සිටියේ අවුරුදු හතරකට වැඩි කාලයක් යුරෝපයේ වාසය කළ අයකුට එහි පුරවැසිභාවය අයදුම් කළ හැකිවා සේ කොළඹ දිස්ත්‍රික්කයේ අවුරුදු 05 කට වැඩි කාලයක් ජීවත් වූ උතුරු-නැගෙනහිර දෙමළ වැසියකුට කොළඹ දිස්ත්‍රික්කයේ පුරවැසිභාවය ඉල්ලුම් කළ හැකිව තිබෙනවා ද කියායි. ඒ සම්බන්ධයෙන් හෙතෙමේ දුන් පිළිතුර වූයේ කෙටි සිනහවකි.